www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005*

# තෙවැනි දේශනය: බෝල්ශේවික්වාදයේ සම්භවය හා "කල යුත්තේ කුමක් ද?"

## 1 කොටස

**Lecture three: The Origins of Bolshevism and *What Is To Be Done?* Part 1**

**ඩේවිඩ් නෝත් විසිනි**
**2005 සැප්තැම්බර් 06**

*2005 අගෝස්තු මස 14 වැනි දා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ " බෝල්ශේවික්වාදයේ සම්භවය හා ''කල යුත්තේ කුමක් ද? '' යන දේශනයේ පලමු කොටස යි මේ. මේ දේශනය කොටස් හතකින් පල කෙරේ. මෙය පාසැලෙහි පැවැත්වුනු තෙවැනි දේශනය යි.*

### රුසියානු මාක්ස්වාදයේ මූලාරම්භයෝ

දේශපාලනික න්‍යාය පිලිබඳ කවර දිනෙක හෝ ලියැවුනු වඩාත් වැදගත්, ප්‍රගාඪ හා නිසැකවම විප්ලවවාදී වූ කෘතියක් වන ලෙනින්ගේ ''කල යුත්තේ කුමක් ද? '' විශ්ලේෂනය සඳහා අද දින මාගේ දේශනය කැප කෙරෙයි. මේ සා පරිමානයකින් වැරැදි අර්ථ කථනයන්ට ද, විකෘතිකිරීම්වලට ද බඳුන් වූ වෙනත් කෘතීන් වෙතොත් ඒ ඉතා අල්පයෙකි. ධනේශ්වර අධ්‍යාපන ආයතනයන්ට අරක් ගත් නිමක් නැති ලෙනින් විරෝධීන් -- (මේ ඇතැමෙක් 1991 වන තුරු ම ලෙනින්ගේ ගුන ගයන්නන් ලෙස පෙනී සිටියෝ වෙති) -- ට අනුව, විසි වන සියවසේ සෑම නපුරක ම නො වේ නම් ඉන් බොහොමයක උල්පත මෙම කෘතිය යි. මේ හෙලා දැකීම්වලට පිලිතුරු දීම මගේ බලාපොරොත්තුව යි. තව ද, 1902 දී සාර් රුසියාවේ දේශපාලන පසුබිම තුල ක්‍රියාත්මක වූ කුඩා සමාජවාදී ව්‍යාපාරයක් සඳහා ලියැවුනු මෙම කෘතිය; 21 වන සියවසේ මුල් දශකයේ සමාජවාදී ව්‍යාපාරයට ඒ සා සුවිශේෂ මට්ටමකින් න්‍යායිකව හා ප්‍රායෝගිකව අදාලවන්නේ කුමක් නිසා දැයි පැහැදිලි කිරීම ද, මගේ බලාපොරොත්තුව යි.

දහනව වන සියවසේ අවසාන තුනෙන් පංගුව තුල, ජර්මනියේ මාක්ස්වාදී ව්‍යාපාරයේ වර්ධනය ගැන කථා කරන විට එහි නැගීම නො නැවැත්වියහැකි හා කුනාටුවක ලක්ෂන පෙන්නුම් කල බව මම අවධාරනය කරමි. පුදුම එලවන තරමේ කෙටි කාල පරිච්ඡේදයක් තුල, කම්කරු පන්තියේ ජනතා සංවිධානය ලෙස ඉස්මතු වීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමත් වූයේ ය. එය අත්පත් කර ගත් ජයග්‍රහනයන්, සැබෑ අරගලයෙන් හා පරිත්‍යාගයෙන් තොර ව නො දිනිය හැකිව තිබුනි. එහෙත්, ජර්මානු සමාජවාදීන් වැඩ කරමින් සිටි පරිසරය; අවම වසයෙන් කිව හොත් රුසියානු විප්ලවවාදීන්ට මුහුන පෑමට සිදු වූ තත්වය සමග සැසැඳීමේ දී; සාපේක්ෂව හිතකර එකක් වූ බව කෙනෙකුට නොවැලැක්විය හැකි පරිදි හැඟී යයි.

සනාථ කෙරී ඇති පරිදි ලෝකයේ බලගතු ම විප්ලවකාරී සමාජවාදී සංවිධානය රුසියාව තුලින් මතුවීම පැහැදිලි කිරීමේ ප්‍රයත්නයක යෙදෙමින් ලෙනින් පසු කලෙක මෙසේ ලිවී යඃ

රුසියාව "එක ම නිවැරදි විප්ලවවාදී න්‍යාය වන මාක්ස්වාදය අත්පත් කොට ගත්තේ, සැබැවින් ම වේදනා සහගතව හා අඩ සියවසක නො ඇසූ විරූ වධ වේදනාවන් හා පරිත්‍යාගයන් ද නො ඇසූ විරූ විප්ලවකාරී වීර්යය හා නො ඇදහිය හැකි ධීර ශක්තියෙන් ද කැපවීමෙන් ද යුතු ව සිදු කල ගවේශනයේ, අධ්‍යයනයේ, භාවිතය තුල පිරික්සීමේ, බලාපොරොත්තු කඩවීමේ, නිරවද්‍ය බව තහවුරු කර ගැනීමේ හා යුරෝපීය අත්දැකීම් සමග සසඳා බැලීමේ ක්‍රියාවලියක් තුලිනි." [1]

අධිරාජ්‍ය හමුදාවේ ඉහල නිලධාරීන් කන්ඩායමක් විසින් සාර් ඒකාධිපතිත්වය පෙරලා දැමීමේ අසාර්ථක ප්‍රයත්නයක් දූරු 1825න් ආරම්භ වූයේ රුසියාව තුල ආත්ම පරිත්‍යාගයේ, අදූෂිත භාවයේ හා එඩිතර ආවේගශීලීත්වයේ සම්ප්‍රදායයකි. සාර් ඒකාධිපතිත්වයේ බිහිසුනු හා නින්දිත යථාර්ථය ද, සමාජ පසුගාමිත්වය මත එය දූරු අධිකාරය ද පෙරලාදැමීම සඳහා වූ කුරුස යුද්ධයක මානය අත්කරගත් මෙම ප්‍රයත්නය යටින්

පැවතියේ රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය ද, රුසියානු නවකථා හා සාහිත්‍ය විචාරයෙන් මතුව ආ රුසියානු බුද්ධිමතුන්ගේ අත්‍යසාමාන්‍ය සමාජ හා සංස්කෘතික ප්‍රපංචයේ පැනනැගීම යි.

තව මත් සමාජවාදියෙකු ලෙස ඔහු ගත කල වසරවල මැක්ස් ඊස්ට්මන් විසින් ලියන ලද "තරුන ට්‍රොට්ස්කි" නම් චරිතාපදානයෙහි එන එක් අපූර්ව ඡේදයක, රුසියානු විප්ලවවාදී පෞරුෂය මෙසේ විස්තර කෙරෙයිඃ

"රුසියානු විප්ලවය සාක්ෂාත් කිරීම සඳහා අපූර්ව මිනිසුන් හා ගැහැනුන්ගෙන් සමන්විත පරපුරක් බිහිව තිබින. ඔබ සංචාරය කරන රටේ කුමන හෝ දුරබැහැර පලාතක දී දුම්රිය මැදිරියක් තුල හෝ බස් රියක් තුල නිහඬ, දැඩි, කල්පනාකාරී මුහුනක් දකින්නට ලැබෙයි. සුදු වන් දාර්ශනික නලල් තලයකින් හා දුඹුරු පැහැ මුදු රැවුලකින් ද යුත් මැදිවියේ මිනිසෙක්. නැතහොත් තියුනු ව වක් වූ ඇහි බැමින් ද දැඩි මාතෘත්වය පලකරන මුව පෙදෙසකින් හෙබි වැඩිමහලු ස්ත්‍රියක් හෝ සමහර විට මැදි වයසේ පිරිමියෙකු ද එසේත් නැතහොත් තව මත් ආකර්ශනීය රූ සපුවකින් හෙබි, එහෙත් කාල තුවක්කුවක් වෙත පිය නගා ඇතිවා සේ බර අඩි තබමින් පියමනින තරුනියක් ඔබ විමසා බලන්නේ නම් ඔබට සොයාගත හැක්කේ ඔවුන් 'පක්ෂයේ පැරනි ක්‍රියාකාරීන්' බව ය.

ත්‍රස්තවාදී ව්‍යාපාරයේ සම්ප්‍රදායෙන් හැදීවැඩුනු ආත්ම පරිත්‍යාගයේ හා විශ්වාසයේ තිරසාර හා උදාර උරුමයෙන් පෝෂනය වූ ලදරු වියේ දී මනුෂ්‍ය වර්ගයාට ආදරය කිරීමටත් හැඟීම්බර නො වී සිතීමටත්, තමාගේ ම ස්වාමියා වීමටත් සිය සමාගමය තුල මරනය පවත්නා බව පිලිගැනීමටත් උගන්වන ලද්දා වූ ත් මේ පරපුර, තුරුනු වියේ දී තවත් යමක් උගෙන සිටියහ. ඒ ප්‍රායෝගික ව සිතීමට යි. සිය අභිමතාර්ථයෙහි හා පිටුවාහලේ උදුනෙන් මොවුහු පන්නරය ලැබූහ. බොහෝ දුරට ඔවුන් වංශවතුන්ගෙන් පැවත ආ අතර වීරත්වය පිලිබඳව විශ්වාසය තැබිය හැකි තෝරාගත් ගැහැනුන් හා මිනිසුන්ගෙන් සැදුම් ලත් වට මේසයේ නයිට්වරුන් හෝ සමුරායිවරුන් වන් මොවුන්ගේ උදාරත්වයෙහි පේටන්ට් පත්‍ර අයත් වූයේ අතීතයට නොව අනාගතයට ය." [2]

රුසියානු විප්ලවාදී ව්‍යාපාරය එහි මුල් අවධීන් තුල කම්කරු පන්තිය වෙත යොමු නො වූ අතර ඒ වෙනුවට එය නැඹුරු වූයේ ජනගහනයෙන් අති මහත් බහුතරය සැදුම් ලත් ගොවි ජනතාව වෙත ය. 1861 දී, ගොවීන් ප්‍රවේනි දාස භාවයෙන් විධිමත් ලෙස මුදා හැරීම පිලිබඳ දෙ වන ඇලෙක්සැන්ඩර් සාර්ගේ ප්‍රකාශය, රුසියානු අධිරාජ්‍යයේ සමාජ-දේශපාලන ව්‍යූහයේ පරස්පරයන් තීව්‍ර කිරීමට හේතු විය. 1870 දශකයේ දී තරුන ශිෂ්‍යයන්ගේ සැලැකිය යුතු ව්‍යාපාරයක පැන නැගීම දක්නට ලැබුනු අතර ගොවීන් අතරට ගිය මොවුන්, ගොවීන්ට අධ්‍යාපනය ලබා දීමට ද, ඔවුන් දැනුවත් සමාජ දේශපාලන ජීවිතය කරා ගෙන ඒමට ද ක්‍රියා කලේ ය. මෙම ව්‍යාපාරයන් තුලට ප්‍රධාන දේශපාලන බල පෑම ගෙන ආවේ ලැව්රොව් හා බකුනින් ප්‍රමුඛ අරාජකවාදයේ න්‍යායාචාර්යවරුන් වෙතිනි. එයින් ද, විශේෂයෙන් ම බකුනින්, ගොවි ජන නැගිටීමකින් රුසියාවේ විප්ලවවාදී පරිවර්තනයක් සිදු වෙතැයි අපේක්ෂා කලේ ය. ගොවි ජනතා වෙතින් පලවූ උදාසීනත්වය ද, රාජ්‍ය මර්දනය ද යන දෙකම එකතු වීමෙන් මෙම ව්‍යාපාරයේ අරගලය කුමන්ත්‍රනකාරී හා ත්‍රස්තවාදී විධික්‍රම උපයෝගී කර ගන්නා තැනට සේන්දු වූයේ ය. මෙ වන් ත්‍රස්තවාදී සංවිධාන අතර වැදගත් ම එක වූයේ, 'නරෝද්නායා වොල්යා' හෙවත් 'ජනතා අපේක්ෂාව' යි.

**මතු සම්බන්ධයි**

**සටහන්:**

1. *"Left-Wing" Communism, An Infantile Disorder* ("වාමාංශික" කොමියුනිස්ට්වාදය ලදරු වලිප්පුවකි) නිව් යෝක්ඃ ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්, 1969. පි. 11.

2. ලන්ඩන්ඃ නිව් පාර්ක්, 1980, පිටු 53-54.

© www.wsws.org